# 13. බැංකු සහ මූල්‍ය

*බැංකු අංශයේ වර්ධනය අඛණ්ඩව සිදු විය. වැඩිවන තරඟකාරිත්වය හේතුවෙන් බැංකු විසින් ගනුදෙනුකරුවන් වෙත වැඩි පහසුකම් ලබාදෙනු ලැබිණ.*

### *තැන්පතු රාශිකරණය*

▲ වාණිජ බැංකු (සියයට 14) සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව (සියයට 13) මගින් රාශිකරණය කළ තැන්පතු තවදුරටත් ඉහළ ගියේය. පොලී අනුපාතික වැඩිවීමත් සමග, වසරෙහි අවසන් කාලයේ මූර්ත පොලී අනුපාතික සලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවිය.

### *විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු*

▲ දනට විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ක්‍රම හතරක් ක්‍රියාත්මකව පවතී. 1978 දී අනේවාසික විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම් ක්‍රමය හඳුන්වා දුන් අතර, අනතුරුව, තවත් තැන්පතු යෝජනා ක්‍රම 3 ක්, එනම්, නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ක්‍රමය (1980), නේවාසික විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ක්‍රමය (1991) සහ අපනයනකරුවන් සඳහා විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ක්‍රමය (1994) හඳුන්වා දෙන ලදී.

▲ 2000 දෙසැම්බර් මස අවසානයේදී දේශීය බැංකු ඒකකවල පැවති මුළු විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 1,074 ක් විය.

▲ 2000 වසරේදී අන්තර්ජාතික වෙළෙඳපොළවල පොලී අනුපාතික වැඩිවීම අනුගමනය කරමින්, 2000 දෙවෙනි භාගය තුළදී, වාණිජ බැංකු විසින් තැන්පතුකරුවන් වෙත ආකර්ශණීය පොලී අනුපාතික ලබා දෙමින් ඔවුන්ගේ විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතුවල පොලී අනුපාතික ඉහළ දමන ලදී.

### *බැංකු පහසුකම්*

▲ රට තුළ ක්‍රියාත්මක වන බැංකු පුළුල් වීමත් සමග, බැංකු ඝනත්වය එනම්, පුද්ගලයින් 10,000 කට සේවය සපයනු ලබන බැංකු ශාඛා සංඛ්‍යාව දනට 0.56 ක් වී ඇත.

▲ වාණිජ බැංකු සිය කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම වැඩිකිරීම හේතුවෙන් වාණිජ බැංකුවල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය වැඩි වූ අතර ගණුදෙනුකරුවන්ට වැඩි පහසුකම් සපයනු ලැබීය.

▲ ගණුදෙනුකරුවන්ට ඉතා ප්‍රයෝජනවත් පහසුකමක් වූ ණය කාඩ්පත් භාවිතය වැඩිවෙමින් පවතී.

▲ දනට දේශීය වාණිජ බැංකු සහ විදේශීය වාණිජ බැංකු කිහිපයක් විසින් දේශීයව සහ අන්තර්ජාතිකව භාවිතා කළහැකි ණය කාඩ්පත් නිකුත් කරනු ලැබේ.

### *විදේශීය මුදල් තැන්පතු පොලී අනුපාතික*

එ.ජ.ඩොලර්-වාර්ෂික ප්‍රතිශතය

| වර්ෂය/මාසය | ඉතුරුම් තැන්පතු අනුපාතික | ස්ථිර තැන්පතු (එක් අවුරුදු) අනුපාතික | එක්සත් ජනපද මහ බැංකු මුදල් අනුපාතිකය | සය මාසික ලයිබෝ අනුපාතිකය |
|---|---|---|---|---|
| 1999 දෙසැ. | 2.50-5.25 | 5.00-6.13 | 5.50 | 6.13 |
| 2000 ජනවාරි | 2.50-5.25 | 5.00-6.00 | 5.50 | 6.00 |
| පෙබරවාරි | 2.50-5.50 | 5.00-6.18 | 5.75 | 6.29 |
| මාර්තු | 2.50-5.50 | 5.00-6.15 | 6.00 | 6.33 |
| අප්‍රේල් | 2.50-5.50 | 5.00-6.40 | 6.50 | 6.53 |
| මැයි | 2.50-5.50 | 5.00-6.34 | 6.50 | 7.11 |
| ජූනි | 2.50-5.70 | 5.00-6.50 | 6.50 | 7.00 |
| නොවැම්බර් | 2.50-5.75 | 6.00-6.75 | 6.50 | 6.64 |
| දෙසැම්බර් | 2.50- 5.90 | 6.00- 6.90 | 6.50 | 6.20 |
| 2001 ජනවාරි | 2.50 -6.25 | 5.75-7.00 | 6.00 | 5.48 |

මූලයන් : ලංකා බැංකුව, මහජන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, හොංකොං සහ ෂැංහයි බැංකුව, සම්පත් බැංකුව සහ සෙලාන් බැංකුව

*13.1 සංඛ්‍යා සටහන*

## වාණිජ පත්‍ර

- ▲ සමාගම්වලට සැලකිය යුතු අරමුදල් ප්‍රමාණයක් වාණිජ පත් භාවිතා කිරීමෙන් සපයා ගැනීමට මෑත කාලයේදී හැකි වූ අතර මෙම වාණිජ පත්‍ර වඩා ජනප්‍රියත්වයක් ලබාගෙන තිබුණි.

## ග්‍රාමීය ආදයම් ඉහළ නැංවීම

- ▲ ග්‍රාමීය අංශයෙහි ආදයම් උත්පාදන කටයුතු වර්ධනය කිරීම පිණිස පසුගිය වසර කිහිපය තුළදී ප්‍රතිපත්තිමය පියවර කිහිපයක්ම ගෙන ඇත.
- ▲ ජනමූලික සුළු මූල්‍ය සංවිධානයන් ප්‍රවර්ධනය කිරීම : සමෘද්ධි බැංකු සංගම් සහ ඉසුරු සංවර්ධන සංගම් ඇතිකිරීම.
- ▲ සංවර්ධන බැංකු සහ ඉතිරි කිරීමේ බැංකු පිහිටුවීමට පෞද්ගලික අංශය දිරිගැන්වීම : සණස සංවර්ධන බැංකුව, ප්‍රමුඛ ඉතිරි කිරීම් සහ සංවර්ධන බැංකුව සහ සෙලින්කෝ සංවර්ධන බැංකුව.
- ▲ දිස්ත්‍රික්ක මත පදනම් වූ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පළාත් මට්ටමෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකු ලෙස නැවත ප්‍රතිසංවිධානය කිරීම.
- ▲ කෘෂිකාර්මික නිෂ්පාදන මිල ගණන් ස්ථායී කිරීම සඳහා ඉදිරි විකුණුම් ගිවිසුම් ක්‍රමයක් පිහිටුවීම.
- ▲ ග්‍රාමීය අංශයට තව දුරටත් ණය පහසුකම් දීම දිරිමත් කිරීමට පොලී සහනාධාර දීම.

## ණය පහසුකම්

- ▲ *නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය*

  මෙම යෝජනා ක්‍රමය, වී සහ අනෙකුත් අතුරු ආහාර භෝග වගා ණය ප්‍රදනය කිරීම සඳහා දිවයින පුරා ක්‍රියාත්මක වේ. මේ සඳහා රජය විසින් පොලී සහනාධාර ලබා දෙනු ලැබේ. මෙම යෝජනා ක්‍රමය යටතේ 2000 වසර අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 294 ක මුදල් ප්‍රමාණයක් ප්‍රදනය කර ඇත.

### බැංකු පහසුකම්

| | 1997 | 1998 | 1999 | 2000 |
|---|---|---|---|---|
| පුද්ගලයින් 10,000 කට වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව | 0.54 | 0.55 | 0.55 | 0.56 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව | 197 | 270 | 316 | 355 |
| නිකුත් කරනු ලැබූ ණය කාඩ්පත් සංඛ්‍යාව | 52,882 | 85,964 | 161,079 | 205,297 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

*13.2 සංඛ්‍යා සටහන*

### වාණිජ පත්‍ර

රුපියල් දශලක්ෂ

| | 1997 | 1998 | 1999 | 2000 |
|---|---|---|---|---|
| මුළු නිකුතුන් | 11,240 | 16,557 | 16,203 | 14,145 |
| නොපියවන ලද ණය | 3,517 | 4,386 | 5,056 | 3,963 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

*13.3 සංඛ්‍යා සටහන*

▲ දෙවැනි බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය

මෙම දෙවැනි බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය, ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබෙන ආධාර මත ක්‍රියාත්මක වන අතර මෙය ණය පහසුකම් සහ අනෙකුත් ආධාර සේවාවන් ලබාදෙමින් බහු වාර්ෂික භෝග අංශය සංවර්ධනය කිරීමට සහ වාණිජකරණය කිරීම පිණිස ආධාර කිරීමට සකසා ඇත.

▲ සුරතුර යෝජනා ක්‍රමය

සුරතුර යෝජනා ක්‍රමය ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමෙන් විරැකියාවෙන් පසුවන තරුණයන්ගේ අදයම් සහ ජීවන තත්ත්වය වර්ධනය කිරීමට ක්‍රියාත්මක කරයි. එම යෝජනා ක්‍රමයට ණය ලබාදෙන ආයතන තුනක් සහභාගී වේ. 1998 දී ආරම්භ වූ මෙම ව්‍යාපෘතියෙහි දෙවන අදියර යටතේ 2000 වසර අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 907 ක ණය ප්‍රමාණයක් ලබාදී ඇත.

### සේවක අර්ථසාධක අරමුදල

▲ සේවක අර්ථසාධක අරමුදලට ලැබුණු මුළු දයක මුදල් ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩි විය. මුළු දයකත්වය 1999 දී සියයට 14 ට සාපේක්ෂව 2000 වර්ෂයේදී සියයට 24 කින් වර්ධනය විය. 2000 වර්ෂයේදී ලැබුනු දයක මුදල් ප්‍රමාණය තුළ හිග මුදල් ගෙවීමක්ද අන්තර්ගතවේ. අරමුදලට දයක වන සේව්‍යයන් සංඛ්‍යාව සියයට 2 කින් වැඩිවිය.

▲ සේවක අර්ථසාධක අරමුදලේ මුළු ආයෝජන ප්‍රමාණය 1999 අවසානයේදී රුපියල් බිලියන 186 සිට 2000 අවසානයේදී රුපියල් බිලියන 215 දක්වා වැඩි විය.

### ක්‍රියාත්මක වන අනෙකුත් ණය යෝජනා ක්‍රම

| ණය යෝජනා ක්‍රමය | අරමුණ |
|---|---|
| ඉඩම් නොමැති අය සහ සුළු ගොවීන් සඳහා වන ණය ව්‍යාපෘතිය | රැකියා අවස්ථාවන් වැඩිකිරීම සහ ඉතිරිකිරීම් පුරුදු වැඩිදියුණු කිරීම සඳහා වන ආර්ථිකමය වශයෙන් ලාභදායී තිරසාර සුළු ණය ක්‍රමයක් ඇති කිරීම |
| කෑගල්ල දිස්ත්‍රික්ක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල) ව්‍යාපෘතිය | ආදයම් උපයන කාර්යයන් ඉහළ නංවමින් ව්‍යාපෘති ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම |
| තේ සංවර්ධන ව්‍යාපෘතිය | තිරසාර පදනමක් මත කුඩා තේ වතු හිමියන්ගේ ආදයම් ඉහළ නැංවීම සහ ව්‍යාපෘති ප්‍රදේශය තුළ පවත්නා ස්වභාවික පරිසර තත්ත්වය වැඩිදියුණු කිරීම |
| දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | දකුණු පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම |
| වයඹ පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | ව්‍යාපෘති බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ ආර්ථික, සාමාජීය හා පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම |
| උතුරුමැද පළාතේ සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | අඩු ආදයම් ඇති පවුල්වල දිළිඳු බව අඩු කිරීම සහ ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සහ රැකියා අවස්ථා වැඩිකිරීම. |
| ආහාර සහ පෝෂණ සංවර්ධන ණය ව්‍යාපෘතිය | රට තුළ ආහාර නිෂ්පාදනය සහ ආහාර සැකසීමේ තාක්ෂණික ක්‍රම වැඩිදියුණු කිරීම |
| නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය | වඩා ඉහළ තත්තවයෙන් යුත් ශ්‍රමබලකායක් ඇතිකිරීම සඳහා නිපුනතාවයන් පුහුණු කිරීමේ වැඩසටහන්හි තත්තවය හා අදළතාවය දියුණු කිරීම |
| ජපාන යූ-කෝ කුඩා ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය | වියදම් අඩු සහ තිරසාර ඉතා කුඩා ප්‍රමාණයේ ණය මුදහැරීම් ක්‍රමයක් පිහිටුවීම මගින් රැකියා අවස්ථා සහ ඉතුරුම් පුරුදු වැඩිදියුණු කිරීම |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

13.4 සටහන

- සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ආපසු ගෙවීම් රුපියල් බිලියන 11 ක් වූ අතර එය පසුගිය වර්ෂයට වඩා සියයට 37 ක වැඩි වීමකි.

## සේවක භාරකාර අරමුදල

- සේවක භාරකාර අරමුදල සේවායන් විසින් දයක මුදල් ගෙවනු ලබන අරමුදලක් වේ. සේවක භාරකාර අරමුදලට සමාගම්වල කොටස් වැනි පෞද්ගලික අංශයේ මූල්‍ය උපකරණවල ආයෝජනය කළ හැකිය.
- සේවක භාරකාර අරමුදලෙහි මුළු ආයෝජනයන් 2000 අවසානයට රුපියල් බිලියන 29 ක් විය. සේවා යෝජකයන් 35,280 ක් මෙම අරමුදලට දයක වූහ.

## කොටස් වෙළෙඳපොළ

- කොටස් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය 2000 දී ද ඉතා පහළ මට්ටමක පැවතුණි. ලැයිස්තුගත කරන ලද සමාගම් ගණනාවක ඉතා සතුටුදයක ලෙස ආදයම් ඉහළ ගියද, ආරක්ෂක හේතුන් මත පැන නැගුණු අවිනිශ්චිතතාව, ද්‍රවශීලතාව අඩුවීම හා විදේශීය ආයෝජකයන්ගේ අඩු දයකත්වය මෙම තත්ත්වයට ප්‍රධාන හේතුවිය.
- කොටස් මිල දර්ශක සහ වෙළෙඳපොළ පිරිවැටුම අඩුවීමේ ප්‍රවනතාවයක් පෙන්වීය.
- කොටස් වෙළෙඳපොළ කටයුතු 2001 වසරේදී යථා තත්ත්වයට පත්වීමක් අපේක්ෂා කරන අතර, දැනටමත් විදේශීය ආයෝජකයන් ශුද්ධ ගැනුම්කරුවන් වී තිබේ.